සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved]

කො/විශාඛා විද්‍යාලය කොළඹ - 05

Co/ Visakha Vidyalaya, Colombo - 05

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ)විභාගය, 2021

General Certificate of Education (Adv. Level) Examination, 2021

ජීව විද්‍යාව I Biology I	09 S I	පැය දෙකයි *Two hours*

13 ශ්‍රේණිය - අවසාන වාර අනාවරණ පරීක්ෂණය - 2021 නොවැම්බර්
Grade 13 - Final Term Diagnostic Test - 2021 November

උපදෙස් :

❊ මෙම ප්‍රශ්න පත්‍රය පිටු **10** කින් යුක්ත වේ.
❊ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
❊ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබගේ විභාග අංකය ලියන්න.
❊ **1** සිට **50** තෙක් වූ එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරු වලින් **නිවැරදි හෝ ඉතාමත් ගැලපෙන හෝ** පිළිතුර තෝරාගෙන,**එය උත්තර පත්‍රයේ පිටු පස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

1. ඉලෙක්ට්‍රෝන අන්වීක්ෂයෙන් පමණක් දැකගත හැකි උප සෛලීය සංඝටකය වන්නේ,

(1) න්‍යෂ්ටිය ය. (2) මයිටකොන්ඩ්‍රියම ය. (3) හරිතලවය ය.
(4) රයිබසෝම ය. (5) පිෂ්ඨකනිකාව ය.

2. මෙහි දැක්වෙන කාබනික අණුව සම්බන්ධයෙන් නිවැරදි ප්‍රතිචාරය තෝරන්න.



(1) A හිස කොටස වන අතර එහි ග්ලිසරෝල් අණුවක් අන්තර්ගතය.
(2) B, ද්විත්ව බන්ධන එකක් පවතින අසංතෘප්ත අණුවකි.
(3) C, ට්‍රාන්ස් (trans) වර්ගයේ සංතෘප්ත මේද අම්ලයකි.
(4) A හි පොස්පරස් අන්තර්ගත කෝලීන් අණුවක් අඩංගු වේ.
(5) C හි ඇති නැමීම ප්ලාස්ම පටලයෙහි ව්‍යුහය පවත්වා ගැනීමට වැදගත් නොවේ.

3. සෛල විභාජනයකදී සිදුවන ක්‍රියාවලි කිහිපයක් පහතින් දක්වා ඇත.

(i) එක් වර්ණදේහයක ඇති වර්ණදේහාංග යුගලය ප්‍රවේණිකව සර්වසම නොවේ.
(ii) සහෝදර වර්ණදේහාංශවල කයිනටකෝර්වලට ධ්‍රැව දෙකෙන්ම විහිදෙන ක්ෂුද්‍ර නාලිකා සම්බන්ධවීම.
(iii) තුරුව සකස් වී නොමැති අතර තර්කුව සෛල මධ්‍යයේ පිහිටයි

ඉහත සෛලය හා විභාජනය පිළිබඳ නිවැරදි වන්නේ,

(1) ශාක සෛලයකි. ඌනනය II විභාජනය පෙන්වයි.
(2) ශාක සෛලයකි. ඌනනය I විභාජනය පෙන්වයි.
(3) සත්ත්ව සෛලයකි. ඌනනය II යෝග කලාව පෙන්වයි.
(4) සත්ත්ව සෛලයකි. අනුනන විභාජනයේ යෝග කලාව පෙන්වයි.
(5) ශාක සෛලයකි. අනුනන විභාජනයේ යෝග කලාව පෙන්වයි.

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers • Model Answers • Study Resources

4. එන්සයිම පිළිබඳ නිවැරදි වගන්තිය තෝරන්න.
   (1) එන්සයිමයේ සියලුම බන්ධන අධික ආම්ලිකතාවලදී බිඳ වැටේ.
   (2) සමහර ජීවීන්ගේ එන්සයිම ක්‍රියාකාරිත්වයේ ප්‍රශස්ත උෂ්ණත්වය 70°C පමණ වේ.
   (3) සියලුම නිශේධක, එන්සයිමවල සක්‍රිය ලක්ෂ්‍යවලට ස්ථිර ලෙස බැඳේ.
   (4) ADP ඇලෝස්ටරික නිශේධකයක් ලෙස සමහර ප්‍රතික්‍රියාවලදී භාවිත වේ.
   (5) ඇලොස්ටරික සක්‍රියකය සැමවිටම සහයෝගීතාව පෙන්වයි.

5. C_4 ප්‍රභාසංසස්ලේෂණය C_3 ප්‍රභාසංස්ලේෂණයෙන් වෙනස් වන්නේ, C_4 ප්‍රභාසංසස්ලේෂණයේදී,
   (1) පත්‍ර මධ්‍ය සෛලවල හරිතලව තුළදී ආලෝක ප්‍රතික්‍රියාව මෙන්ම අඳුරු ප්‍රතික්‍රියාවද සිදුවීම.
   (2) ආලෝක ප්‍රතික්‍රියාවෙන් නිපදවනු ලැබූ ATP හා NADPH වල ශක්තියෙන් CO_2 ඔක්සිහරණය කිරීම
   (3) රුබිස්කෝ එන්සයිමය අවකාශමය වශයෙන් වෙන්වීම හේතුවෙන් ප්‍රභාශ්වසනය වැළැක්වීම.
   (4) පත්‍ර මධ්‍ය සෛල හරිතලව සාපේක්ෂව කුඩා අතර ග්‍රානාවලින් පොහොසත් වීම.
   (5) ජලය භාවිතා කිරීමේ කාර්යක්ෂමතාව C_3 ශාකවලට වඩා අඩු වීම.

6. අවුඩස් උපකරණය භාවිතයෙන් ප්‍රභාසංස්ලේෂණ සීඝ්‍රතාව මැනීමේ විද්‍යාගාර පරීක්ෂණයකදී අනුගමනය කළයුතු පියවරක් වන්නේ,
   (1) කැපූ කෙලවර පහළට සිටින සේ ජලජ ශාකය කේශික නලයේ කෙලවරට සවි කිරීම.
   (2) පරීක්ෂණ කාලය පුරාවටම විදුලි බල්බයක් මගින් ශාකයට ඒකාකාරී ආලෝකයක් ලබාදීම
   (3) පිටත ජල බීකරයට $NaHCO_3$ මිශ්‍ර කර CO_2 සීමාකාරී සාධකයක් වීම වැලැක්වීම.
   (4) පරීක්ෂණ කාලය තුළදී ප්‍රභාසංස්ලේෂණයට බලපාන සමහර සාධක නියතව පවත්වා ගැනීම.
   (5) O_2 සීමාකාරී සාධකයක් වීම වැලැක්වීමට පිටත ජල බීකරයේ ජලය වාතනය කිරීම

7. ලැක්ටික් අම්ල පැසීම සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
   (1) මෙය මයිටකොන්ඩ්‍රියා තුළ ඇති එන්සයිම මගින් යාමනය කරයි.
   (2) අන්තඵලයක් ලෙස CO_2 නිපදවේ.
   (3) අවසාන හයිඩ්‍රජන් ප්‍රතිග්‍රාහකයා කාබනික සංයෝගයකි.
   (4) සියලුම දිලීර හා සමහර බැක්ටීරියා ලැක්ටික් අම්ල පැසීම සිදු කරයි.
   (5) මෙහිදී පයිරුවේවට් අණු 02 ක් ATP අණුවක් සහ NADH අණුවක් නිපද වේ.

8. ඩාවින් වොලස් වාදයට අනුව අර්ථකථනය කර ඇති නිරීක්ෂණ වන්නේ,
   (1) සංසේචන සම්භාවිතාව ය.
   (2) ප්‍රභේදනය ය.
   (3) රෝගවලට ප්‍රතිරෝධිතාව ය.
   (4) තරගය හා උච්චෝන්නතිය ය.
   (5) හිතකර ලක්ෂණ ස්වභාවිකවරණයට ලක්වීම ය.

9. ආකියා අධිරාජධානිය, යුකැරියා අධිරාජධානියෙන් වෙනස් වන ලක්ෂණයක් වන්නේ, ආකියා අධිරාජධානියේ,
   (1) DNA සමග බැඳුන හිස්ටෝන ප්‍රෝටීන තිබීම.
   (2) පටල ලිපිඩවල ශාඛනය වූ හයිඩ්‍රොකාබන් තිබීම.
   (3) ප්‍රතිජීවක සඳහා සංවේදී වීම.
   (4) ප්‍රෝටීන සංස්ලේෂණයේ ආරම්භක ඇමයිනෝ අම්ලය මෙතියොනින් වීම.
   (5) සෛල බිත්තියේ පොලිසැකරයිඩ තිබීම.

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers • Model Answers • Study Resources

10. නයිට්‍රජන් තිරකරන සහජීවී බැක්ටීරියාවක් හා සයනොබැක්ටීරියාවක් අනුපිළිවෙළින් සඳහන් වන පිළිතුර කුමක් ද?
(1) *Nostoc, Thermococcus*
(2) *Rhizobium, Anabaena*
(3) *E.coli, Salmonella typhi*
(4) *Azotobacter, Anabaena*
(5) *Acetobacter, Nostoc*

11. ප්ලාන්ටේ රාජධානියේ ශාක පෙන්වන ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
- විෂම බීජානුකතාව සහිත ශුකි පාසි ශාකයක් වීම
- ජායා ජන්මානු ශාකය ලෙස කලල කෝෂයක් පැවතීම.
- ශෛලම වාහිනි දරන විවෘත බීජක ශාකයක් වීම
- ද්විලිංගික ජන්මානුශාකයක් නිපදවීම.

ඉහත ලක්ෂණ දරන ශාක අනුපිළිවෙළින් අඩංගු ප්‍රතිචාරය කුමක් ද?
(1) *Lycopodium, Cucurbita, Cycas, Pogonatum*
(2) *Selaginella, Nephrolepis, Marchatia , Anthoceros*
(3) *Lycopodium, Pinus, Gnetum, Nephrolepis*
(4) *Selaginella , Cucurbita, Gnetum, Nephrolepis*
(5) *Pogonatum , Cucurbita , Pinus, Nephrolepis*

12. කෝඩේටා වංශයේ වර්ග දෙකක ජීවීන් පෙන්වන ලක්ෂණ ලැයිස්තු දෙකක් A සහ B ලෙස පහත දැක්වේ.

A	B
• උත්ප්ලවකතාව පාලනයට වාතාශ තිබීම.	• අචලතාපී වීම.
• අණ්ඩජතාව පෙන්වීම.	• අභ්‍යන්තර සංසේචනය පෙන්වීම
• අස්ථිමය සැකිල්ලක් තිබීම.	• වර්ණදෘෂ්ටිය තිබීම.
• වැඩි දෙනෙක් බාහිර සංසේචනය පෙන්වීම.	• දත් රහිත වීම

A හා B වර්ග පිළිවෙළින්,
(1) Osteichthyes , Amphibia
(2) Reptilia , Aves
(3) Mammalia, Chondrichthyes
(4) Osteichthyes, Aves
(5) Aves, Reptilia

13. සෛලම පටකය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) සියලුම සෛල සජීවී වේ.
(2) බීජ රහිත හා බීජ සහිත ශාකවල වාහිනී ඒකක සහ වාහකාභ පිහිටයි.
(3) වාහිනී ඒකකවල සෛල ප්ලාස්මය පර්යන්ත තුනී ස්ථරයක් බවට ක්ෂීන වී ඇත.
(4) වාහකාභ, වාහිනී ඒකක වලට වඩා කෙටි හා පළල්ය.
(5) සජිදු තල අගින් අග පේළියට පිහිටමින් සෛලම වාහිනී සාදා ඇත.

14. ද්විබීජපත්‍රී ශාක පත්‍රයක ව්‍යුහය පිළිබඳ සත්‍ය ප්‍රතිචාරය තෝරන්න.
(1) අපිචර්මය බොහෝ විට සෛල ස්ථර කිහිපයකි.
(2) පූටිකා ප්‍රධාන ලෙස උඩු අපිචර්මය තුළ පවතී.
(3) ඉනිමෑදුස්තර සෛල ස්ථර එකක් හෝ කිහිපයක් පැවතිය හැක.
(4) සච්චර මෑදුස්තර සෛලවල හරිතලව සාපේක්ෂව බහුලව ඇත.
(5) මධ්‍ය නාරටිය පමණක් කලාප කොපුවකින් ආරක්ෂා වී පවතී.

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers • Model Answers • Study Resources
iexamhub

15. ජල විභවය සංකල්පය පිළිබඳ පිළිගත හැකි ප්‍රකාශය කුමක් ද?
   (1) ජල විභවය වැඩි ස්ථානයක සිට අඩු ස්ථානයකට නිදහස් ජල අණු හා ද්‍රාව්‍ය ගමන් කරයි.
   (2) ජල විභවය සඳහා ද්‍රාව්‍ය සාන්ද්‍රණය හා පීඩන අනුක්‍රමණය බලපායි.
   (3) සෛලයක ජල විභවය සංශුද්ධ ජලයේ ජල විභවයට සමාන වේ.
   (4) සංශුද්ධ ජලයේ ගිල්වූ සෛලයක උපරිම φ_p අගය සෛලයක φ_s ට සමාන වේ.
   (5) ශූන්‍යතා පීඩනය වැඩි වන විට සෛලයක ජල විභවය අඩුවේ.

16. ප්ලෝයම පරිසංක්‍රමණයේ පියවර කිහිපයක් පහත දැක්වේ.
   (a) අපායනයේදී සීනි හර කිරීම
   (b) ප්ලෝයම යුෂය ප්‍රභවයේ සිට අපායනය දක්වා තොග ප්‍රවාහය ලෙස ගමන් කිරීම.
   (c) ජලය ප්ලෝයමයේ සිට ශෛලමය වෙත ඉවත් වීමෙන් පෙනේර නළය තුළ පීඩනය අඩුවීම.
   (d) පෙනේර නළය තුළට ශෛලමයේ සිට ආසෘතියෙන් ජලය ඇතුළු වීම නිසා ඒ තුළ පීඩනය වැඩි වේ.
   (e) පෙනේර නළය තුළට සීනි බැර වීම නිසා පෙනේර නළය තුළ ජල විභවය අඩු වේ.

   ප්ලෝයම පරිසංක්‍රමණයේ පියවර නිවැරදි අනුපිළිවෙළින් දක්වා ඇත්තේ පහත සඳහන් කවරක ද?
   (1) d, c, b, e, a   (2) a, b, e, d, c   (3) e, d, a, c, b
   (4) e, d, b, a, c   (5) a, b, c, d, e

17. ශාකවල මූලද්‍රව්‍ය අවශෝෂණය කරන ආකාරය සහ ඒවායේ කෘත්‍ය නිවැරදිව ගළපා ඇති ප්‍රතිචාරය තෝරන්න.

	මූල ද්‍රව්‍යය	අවශෝෂණය කරන ආකාරය	කෘත්‍ය
(1)	P	$H_2PO_4^{-2}$	ATP වල සංඝටකයකි.
(2)	Zn	Zn^{2+}	ආසෘතිය හා අයනික සමතුලිතතාව
(3)	Mg	Mg^{2+}	සංඥා ගමන් කිරීම
(4)	S	SO_4^{-2}	බොහෝ එන්සයිම සක්‍රිය වීම
(5)	Fe	Fe^{3+}	ක්ලෝරෝෆිල් සංශ්ලේෂණය

18. පරාගනය පිළිබඳ වැරදි ප්‍රතිචාරය කුමක් ද?
   (1) පරාග කණිකා පරිණත කලංකය මත පතිත වීම පරාගණයයි.
   (2) පර පරාගනය පර සංසේචනයට හේතු වේ.
   (3) කලංකය මත පරාග කණිකා පතිත වූ පසු ප්‍රරෝහණය වේ.
   (4) පරාග කණිකා එම ශාකයේම වෙනත් පුෂ්පයක කලංකය මත පතිත වීම පර පරාගනයයි.
   (5) විෂමකීලතාව පරපරාගනය සඳහා අනුවර්තනයකි.

19. ශාක වර්ධක ද්‍රව්‍යය හා කෘත්‍යය පිළිබඳ නිවැරදි ගැළපීම කුමක් ද?
   (1) ගිබරලින් - සනාල පටක විභේදනය දිරි ගන්වයි.
   (2) ඔක්සීන - පරාග විකසනය උත්තේජනය කරයි.
   (3) සයිටොකයිනීන් -බීජ ප්‍රරෝහණය උත්තේජනය කරයි.
   (4) එතිලීන් - වර්ධනය නිශේධනය කරයි.
   (5) ඇබ්සිසික් අම්ලය - මුල් හා මූලකේශ වර්ධනය දිරි ගන්වයි.

20. මිනිසාගේ ඛේටය පිළිබඳ පහත වගන්ති අතරින් නිවැරදි වන්නේ කුමක්ද?
   (1) ඛේටයෙහි බැක්ටීරියාවන්ට එරෙහිව ක්‍රියාකරන ප්‍රෝටීන වර්ග 3ක් අඩංගු වේ.
   (2) ඛේටයේ අන්තර්ගත මියුසින් ග්ලයිකොලිපිඩයකි
   (3) ඛේට ඇමයිලේස් මඟින් පිෂ්ටය ග්ලූකෝස් බවට පත්කරයි.
   (4) මුඛය පිරිසිදු කිරීම හා මුඛ ආස්තරණය සිරීම්වලින් ආරක්ෂා කිරීම ඛේටයේ කෘත්‍යයක් වේ.
   (5) ඛේටය ස්‍රාවය වීම ස්නායු ප්‍රතීකයක් මෙන්ම හෝමෝන මඟින් ද යාමනය වේ.

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

21. ආහාර ජීරණ කෘත්‍යයට අමතරව අක්මාව ඉටුකරන වෙනත් කෘත්‍යයක් වන්නේ පහත සඳහන් ඒවා අතරින් කවරක්ද?
(1) ග්ලූකෝස් සමස්ථිතිය සඳහා දායකවීම.
(2) ජලය ප්‍රතිඅවශෝෂණය සම්පූර්ණ කිරීම.
(3) ක්ෂුද්‍ර ජීවීන් ආධාරයෙන් විටමින් සංශ්ලේෂණය කිරීම.
(4) පෝෂක අවශෝෂණය, ජලය හා අයන නැවත ලබාගැනීම.
(5) ක්ෂුද්‍ර ජීවීන්ට එරෙහිව ආරක්ෂාව ලබාදීම.

22. අසාත්මිකතාව පිළිබඳ පහත කිනම් ප්‍රකාශය වැරදිද?
(1) ඇතැම් ප්‍රතිදේහ ජනකවලට දේහය අධික වූ ප්‍රතිචාර දැක්වීම අසාත්මිකතාවයයි.
(2) අධිසංවේදී ප්‍රතික්‍රියා ප්‍රේරණය කරන ප්‍රතිදේහ ජනක වර්ග අසාත්මික කාරක ලෙස ක්‍රියාකරයි.
(3) සමහර පුද්ගලයන්ට ඇතැම් ප්‍රතිජීවකමගින් අසාත්මික ප්‍රතික්‍රියා ඇති කරයි.
(4) කිවිසුම් යාම හා ඇස්වලින් කඳුළු ගැලීම දර්ශීය අසාත්මික ලක්ෂණයන්ය.
(5) තීව්‍ර අසාත්මික තත්ව නිසා රුධිර පීඩනය ඉහළයාමෙන් මරණයද සිදුවිය හැක.

23. පරිවෘත්තිය උපස්තරය හා බහිස්‍රාවී ඵල නිවැරදි ලෙස ගලපා ඇත්තේ පහත සඳහන් කවරකද?.

	පරිවෘත්තීය උපස්තරය	බහිස්‍රාවී ඵලය
(1)	ප්‍රෝටීන	ඇමෝනියා , CO_2
(2)	කාබෝහයිඩ්‍රේට	CO_2 , යූරියා
(3)	මේදය	ජලය , CO_2
(4)	න්‍යෂ්ටික අම්ල	යූරියා , ලැක්ටික් අම්ලය
(5)	කාබෝහයිඩ්‍රේට	ලැක්ටික් අම්ලය , යූරියා

24. සතුන්ගේ ස්වසන ව්‍යුහ කිහිපයක් පහත දැක්වේ.
A - දේහ පෘෂ්ඨය
C - පත් පෙනහැලි
E - ශ්වාසනාල පද්ධති
B - ජලක්ලෝම
D - පෙනහැලි
F - සම

ඉහත ඒවා අතුරින් ආත්‍රොපෝඩා වංශයේ ජීවීන්ගේ දක්නට ලැබෙන ශ්වසන ව්‍යුහ වන්නේ,
(1) A, B හා E ය.
(2) C, D හා E ය.
(3) C, E හා F ය.
(4) B, C හා E ය.
(5) C, D හා F ය.

25. මිනිස් මොළයේ කොටස් කිහිපයක් සහ ඒවායේ කෘත්‍යයන් පහත දී ඇත. එම මොළයේ කොටස හා කෘත්‍යය සංකලනය අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?

	මොළයේ කොටස		කෘත්‍යය
(1)	තැලමස	-	ඉරියව්ව හා සමබරතාව පවත්වා ගැනීම
(2)	සුෂුම්නා ශීර්ෂකය	-	නින්ද හා අවදිවීමේ චක්‍ර යාමනය
(3)	හයිපොතැලමස	-	විවිධ දේහ චලන සමායෝජනය
(4)	අනුමස්තිෂ්කය	-	සංවේදන ප්‍රතිග්‍රාහකවලින් පැමිණෙන සංවේදන ලබා දෙන ප්‍රධාන මධ්‍යස්ථාන
(5)	වැරෝලි සේතුව	-	විශාල පරිමාණයෙන් සිදුවන දේහ චලන සමායෝජනය

26. සංවේදක ප්‍රතිග්‍රාහක පිළිබඳ නිවැරදි වන්නේ පහත සඳහන් කවරක්ද?
(1) රසායනික ප්‍රතිග්‍රාහක සෛල උත්තේජනය වීමට එම රසායනික ද්‍රව්‍ය ජලයේ ද්‍රාවනය වී තිබීම අත්‍යවශ්‍ය නොවේ.
(2) දිවෙහි අපිච්ඡද සෛල විශේෂණය වී රසාංකුර ලෙස සංවිධානය වී ඇත.
(3) ආඝ්‍රාන සංවේදක සෛල ලෙස ස්නායු සෛල කිසිවිටක නොපවතී.
(4) තාප ප්‍රතිග්‍රාහක ස්කන්ධ ප්‍රතිග්‍රාහක වර්ගයකි.
(5) යෂ්ටි සෛල වර්ණ දෘෂ්ටිය සඳහා වැදගත්වේ.

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers • Model Answers • Study Resources
iexamhub

27. ADH හෝමෝනය පිළිබඳ වැරදි ප්‍රකාශය කුමක්ද?
(1) හයිපොතැලමසෙහි නියුරෝනවල සංස්ලේෂණය වේ.
(2) අපර පිටියුටරියේ අක්සන අන්තවල ගබඩා කරයි.
(3) සංග්‍රාහක ප්‍රණාල හා විදූර සංවලිත නාලිකා මත ක්‍රියා කරයි.
(4) රුධිරයේ ආසුැතික පීඩනය සාමාන්‍ය මට්ටම දක්වා අඩු කිරීමට වැදගත් වේ.
(5) වෘක්කවල සංග්‍රාහක ප්‍රණාලයේ ජලයට ඇති පාරගම්‍යතාව අඩු කරයි.

28. පහත සඳහන් ප්‍රජනන ක්‍රම අතුරින් අලිංගික ප්‍රජනන ක්‍රමයක් නොවන්නේ කුමක් ද?
(1) අංකුරණය (2) බීජාණු සෑදීම (3) ද්විඛණ්ඩනය
(4) සංයුග්මනය (5) කඩ කඩවීම

29. මානව හිස් කබල පිළිබඳව සත්‍ය ප්‍රතිචාරය තෝරන්න.
(1) මිනිසාගේ හිස්කබල අස්ථි 22 කින් සමන්විත වේ.
(2) මානව කපාලයේ යුගලමය අස්ථි වනුයේ ශංඛක අස්ථි යුගලය හා පාර්ශ්ව කපාල අස්ථි යුගලය පමණි.
(3) කීලාස්ථය, පීදාස්ථිය හා ලලාටාස්ථිය යන අස්ථි පමණක් කෝටරක දරයි.
(4) අක්ෂ කශේරුකාව හා අපර කපාල සන්ධාන අග්‍ර අතර සන්ධානය හිස ඉහළ පහළ චලනයට ආධාර වේ.
(5) මානව කපාල ධාරිතාව ලීටර 2.5 වේ.

30. "දෙමුහුම් දිරිය" පැහැදිලි වන්නේ පහත වගන්ති අතුරින් කවරකින් ද?
(1) වෙනස් වර්ගයන්ට අයත් ශාක හෝ සතුන් එකිනෙක හා සංවාස කිරීම
(2) එකම විශේෂයකට අයත් ප්‍රවේණික සම්බන්ධතා නොමැති නුමුහුම් අභිජනන ශාක හෝ සතුන් අතර සංවාසය.
(3) ජනකයන්ට වඩා දෙමුහුම් ජීවීන්ගේ තරම, වර්ධන වේගය, සරු භාවය සහ අස්වැන්න වැනි ලාක්ෂණිකවල වැඩි දියුණු වීම.
(4) යම් ගහනයක ප්‍රවේණික යෝග්‍යතාව අඩුවීම.
(5) මෙහිදී සත්‍යාභිජනක පෙල භාවිතා නොකරයි.

31. සුන්‍යෂ්ටික DNA ඇසිරීම පිළිබඳව සත්‍ය වගන්තිය වන්නේ පහත වගන්ති අතුරින් කවරක ද?
(1) ද්විද්ව හෙලික්සය හිස්ටෝන අණු අටකින් යුත් සංකීර්ණයක් වටා එතෙමින් න්‍යුක්ලියෝසෝම සෑදේ.
(2) මෙහිදී අනුයාත නියුක්ලියෝසෝම RNA ද්‍රාව්‍යයකින් එකිනෙක සම්බන්ධවේ.
(3) හතරවන මට්ටමේදී තන්තු පුඩු ඛණ්ඩ ප්‍රෝටීනවලින් සෑදුණු ආධාරකයට සවි වේ.
(4) අනූනන වර්ණදේහය සාදන්නේ DNA ඇසිරීමේ පළමු මට්ටමේදීය.
(5) මෙහිදී 1400nm ඝනකම සහිත යෝගකලා වර්ණදේහාංශ සෑදේ.

32. ප්‍රාග්න්‍යෂ්ටික හා සුන්‍යෂ්ටික DNA ප්‍රතිවලිත ක්‍රියාවලිය පිළිබඳ වැරදි වන්නේ පහත සඳහන් කවරක් ද?
(1) සුන්‍යෂ්ටික වර්ණදේහයක ප්‍රතිවලිතය සඳහා ori ස්ථාන එකකට වඩා වැඩි සංඛ්‍යාවක් තිබිය හැකි අතර ප්‍රාග් න්‍යෂ්ටිකයන්ට ඇත්තේ එක් ori ස්ථානයක් පමණි.
(2) ප්‍රාග් න්‍යෂ්ටික හා සුන්‍යෂ්ටික DNA පොලිමරේස් ව්‍යුහයෙන් වෙනස් වුවද සමාන කෘත්‍යයක් ඉටු කරයි.
(3) ප්‍රාග්න්‍යෂ්ටික DNA ප්‍රතිවලිතය අඛණ්ඩව සිදු වුවද සුන්‍යෂ්ටික යන්ගේ එය සෛල චක්‍රයේ S කලාවේදී පමණක් සිදු වේ.
(4) අලුතින් සංස්ලේෂණය වූ යාබද නියුක්ලියෝටයිඩ අතර හිදැස් මුද්‍රා තැබීමට DNA ලයිගේස් භාවිතා වේ.
(5) ප්‍රතිවලිතයේදී DNA පොලිමරේස් එන්සයිමයට හෙලිකේස් ක්‍රියාකාරිත්වයක් ඇත.

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers • Model Answers • Study Resources
iexamhub

33. ප්‍රවේණිකේතය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත සඳහන් වේ.

(a) එය අතිපිහිත නොවන කේතයකි.

(b) එය කෝඩෝන 64 කින් සමන්විත වේ.

(c) UAA, UAG AUA සමාප්ති කෝඩෝන ලෙස ක්‍රියා කරයි.

(d) AUG මෙතියොනින් සඳහා කේත සපයන ආරම්භක කෝඩෝනය ලෙස ක්‍රියා කරයි.

ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ,

(1) a, b සහ c පමණි. (2) a, b සහ d පමණි. (3) b, c සහ d පමණි.
(4) a සහ b පමණි. (5) c සහ d පමණි.

34. ජල හිඟයට හා අධික උෂ්ණත්වයට ඔරොත්තු දීම සඳහා කාන්තාරවල වැවෙන ශාක දක්වන අනුවර්තනයක් නොවන්නේ පහත සඳහන් කවරක් ද?

(1) මාංශල ශාක දේහයක් පැවතීම
(2) පඳුරුවල මුල් ගැඹුරට විහිදී නොතිබීම
(3) බොහෝ ශාක C_4 ප්‍රභාසංස්ලේෂණය දැක්වීම
(4) පත්‍රවල විෂ රසායනික අඩංගු වීම.
(5) කටු සහිත ශාක පැවතීම.

35. පරිසර පද්ධතියක් පිළිබඳ පහත කිනම් ප්‍රතිචාරය නිවැරදි ද?

(1) පරිසර පද්ධතියක පෝෂී මට්ටම් හරහා ශක්තිය හා පෝෂක මාරුවන චක්‍රීය අනුක්‍රමයක් ඇත.
(2) සැමවිටම සංඛ්‍යා පිරමිඩයක ඉහළ පෝෂී මට්ටම්වල ජීවී වැඩි සංඛ්‍යාවක් අන්තර්ගත වේ.
(3) උඩුකුරු සංඛ්‍යා පිරමිඩ ජලජ පරිසර පද්ධතිවල පමණක් හමුවේ.
(4) කෙටි ආහාර දාමයක ඉහළම පෝෂී මට්ටමේ පවා දිගු ආහාර දාම වලට වඩා වැඩි ප්‍රයෝජ්‍ය ශක්තියක් අන්තර්ගතවේ.
(5) ප්‍රාථමික නිෂ්පාදකයින්ගේ විශාල ශුද්ධ ජෛව ස්කන්ධයක් මගින් පාරිභෝජකයින්ගේ වඩා කුඩා ජෛව ස්කන්ධයක් පෝෂණය කිරීමෙන් යටිකුරු ජෛව ස්කන්ධ නිර්මාණය කරයි.

36. මෙම ප්‍රශ්නය පහත සඳහන් පාරිසරික සම්මුති මත පදනම් වේ.

(a) මාපොල් සම්මුතිය
(b) කියෝතෝ සම්මුතිය
(c) මොන්ට්‍රියල් සම්මුතිය
(d) රම්සා සම්මුතිය
(e) CITES සම්මුතිය

වායුගෝලීය දූෂණය වැලැක්වීමට හෝ එය පුරැකීම පිළිබඳ වඩාත්ම දායක වන්නේ ඉහත සඳහන් කිනම් සම්මුතිය ද? සම්මුති ද?

(1) a හා b ය. (2) b හා c ය. (3) c හා d ය.
(4) d හා e ය. (5) b හා c ය.

37. වෛරස පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි වන්නේ කුමක් ද?

(1) ධාරක සෛලයට ගැලපෙන පරිදි ප්‍රෝටීන සංස්ලේෂණ යන්ත්‍රණ වෛරස වලට ඇත.
(2) ඇඩිනොවෛරස හෙලිකල් වෛරසයකි.
(3) වෛරස වල ව්‍යාංශජනක චක්‍රයේදී ධාරකසෛල ජාරනය කරමින් ඒවා ගුණනය වේ.
(4) ජාරක ජීවන චක්‍රයක ජෛව සංස්ලේෂණ පියවරේදී ධාරක සෛලවල DNA බිඳ වැටේ.
(5) වෛරස සමහරක් අනිවාර්ය පරපෝෂිතයන් වේ.

38. මිනිසාගේ ආහාර ජීර්ණ පද්ධතියේ රෝග ඇති කරන ක්ෂුද්‍ර ජීවියකු නොවන්නේ,

(1) *Salmonella typhi*
(2) *Streptococcus pyogenes*
(3) *Vibrio cholera*
(4) Hepatitis A virus
(5) *Staphylococcus aureus*

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers • Model Answers • Study Resources
iexamhub

39. පාංශු ක්ෂුද්‍ර ජීවීන්ගේ ස්වභාවය හා කාර්යභාරය සම්බන්ධව පහත සඳහන් ප්‍රකාශ අතරින් සත්‍ය වන්නේ කුමක් ද?

(1) මූල ගෝලය අධිකතම ජෛව විවිධත්වයක් සහිත හා ස්ථිතික වාසස්ථානයකි.

(2) පොස්පරස් හා සින්ක් වැනි සචල පෝෂක ලබා ගැනීම දිලීරක මූල් මගින් වේගවත් කරයි.

(3) මෙතනොට්‍රෝෆ්ස් ක්ෂුද්‍ර ජීවීන් සාගරවල නිපදවෙන මීතේන් වලින් වැඩි කොටසක් පරිභෝජනය කරයි.

(4) පාංශු ක්ෂුද්‍ර ජීවීන්ගෙන් බහුතරය දිලීර වෙයි.

(5) නයිට්‍රිකාරී බැක්ටීරියාවක් වන *Nitrosomonas* පසේ ඇති නයිට්‍රයිට් අයන, නයිට්‍රේට් බවට පත් කරයි.

40. ආහාර නරක් වීම පිළිබඳ පහත සඳහන් ප්‍රකාශන අතරින් සත්‍ය වන්නේ කුමක් ද?

(1) පූතිභවනයේදී මධ්‍යසාර හා වායු වර්ග ඇති වේ.

(2) දොඩම්, කෙසෙල් වැනි පලතුරු බැක්ටීරියා මගින් පහසුවෙන් නරක් වේ.

(3) ඉතා අඩු තෙතමනයක් ඇති ආහාර නරක් නොවේ.

(4) බැක්ටීරියා සාමාන්‍යයෙන් pH 5 - 9 පරාසයක ඇති ආහාර මත හොඳින් වැඩේ.

(5) ලුණු හා සීනි අඩංගු ආහාර ආශූතකාමී යීස්ට් හා ලවණකාමී බැක්ටීරියා මගින් නරක් වේ.

❖ **අංක 41 සිට 50 තෙක් ප්‍රශ්න වලට පහත උපදෙස් පිළිපදින්න.**

මෙහි දී ඇති ප්‍රතිචාර අතරින් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ නිවැරදිය නිවැරදි ප්‍රතිචාරය/ප්‍රතිචාර තෝරා ඒ සඳහා අදාළ නිවැරදි අංකය යොදන්න.

A ,B, D ප්‍රතිචාර පමණක් නිවැරදි නම් ...., (1)
A ,C ,D ප්‍රතිචාර පමණක් නිවැරදි නම් .... (2)
A ,B ප්‍රතිචාර පමණක් නිවැරදි නම් .... (3)
C ,D ප්‍රතිචාර පමණක් නිවැරදි නම් .... (4)
වෙනත් කිසියම් ප්‍රතිචාරයක් හෝ ප්‍රතිචාර සංයෝජනයක් නිවැරදි නම් .... (5)

උපදෙස් සම්පිණ්ඩනය				
(1)	(2)	(3)	(4)	(5)
A ,B, D පමණක් නිවැරදිය	A ,C ,D පමණක් නිවැරදිය	A ,B පමණක් නිවැරදිය	C ,D පමණක් නිවැරදිය	ප්‍රතිචාරයක් හෝ ප්‍රතිචාර සංයෝජනයක් හෝ නිවැරදිය.

41. මෙම ප්‍රශ්නය පහත සඳහන් සෛල බිත්ති සංඝටක මත පදනම් වේ.

ලිග්නින්, සෙලියුලෝස්, පෙක්ටින්, පෙප්ටිඩෝග්ලයිකෑන්, සුබෙරින්

ඉහත සඳහන් සංයෝග අතුරින් ශාක සෛලයක ද්විතික බිත්තියේ අන්තර්ගත වන සංයෝග සංකලනය කුමක් ද?

(A) සිලිකා, පෙක්ටින්, පෙප්ටිඩෝග්ලයිකෑන්

(B) පෙක්ටින්, සෙලියුලෝස්, කයිටින්

(C) සෙලියුලෝස්, පෙක්ටින්, ලිග්නින්

(D) සුබෙරින්, පෙක්ටින්, ලිග්නින්

(E) සිලිකා, කයිටින්, සුබෙරින්

42. දිලීර රාජධානිය පිළිබඳ නිවැරදි වගන්තිය /වගන්ති වන්නේ,

(A) සියලුම දිලීර යෝෂක දරයි.

(B) *Chytridiomycota* වංශයේ දිලීර ජලජ පරිසරවල පමණක් ජීවත් වේ.

(C) *Agaricus* නිපදවන බැසිඩි බීජාණු බහිර්ජන්‍ය වේ.

(D) *Ascomycota* වංශයේ බොහෝ දිලීර වියෝජකයින් වේ.

(E) *Mucor* වල අලිංගික ප්‍රජනක බීජාණු ප්‍රවේණිකව අසමාන ඒකගුණ බීජාණු වේ.

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers • Model Answers • Study Resources
iexamhub

43. තුලාෂ්ම කල්පිතය සම්බන්ධව නිවැරදි ප්‍රකාශය / ප්‍රකාශ වන්නේ කුමක් ද?
   (A) මූලාග්‍ර කොපුවේ ඉහළ කොටසේ තුලාෂ්ම ඒකරාශීවීමෙන් Ca^{+2} ප්‍රතිසංවිධානය වීම සිදු වේ.
   (B) මුල තුළ ඔක්සීන පර්යන්තව පරිවහනය වීම සිදු වේ.
   (C) මුලේ සෛල දික්වන කලාපයේ යටි පැත්තේ Ca^{+2} හා ඔක්සීන ඒකරාශී වීම සිදු වේ.
   (D) අධික ඔක්සීන සාන්ද්‍රණය මගින් මුලේ සෛල දික්වීම නිශේධනය කරයි.
   (E) මුලෙහි යටි පැත්තේ සෛල සීඝ්‍ර වර්ධනයක් ද උඩු පැත්තේ සෛල සෙමෙන් වර්ධනයක් ද වී මුල ඉහළ වර්ධනය වේ.

44. පුරුෂ ප්‍රජනක පද්ධතිය හා සම්බන්ධ අතිරේක ග්‍රන්ථි පිළිබඳ පහත කිනම් ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි ද?
   (A) බල්බොයුරේත්‍රල් ග්‍රන්ථිය පැහැදිලි ක්ෂාරීය ශ්ලේෂ්මලයක් ස්‍රාවය කරයි.
   (B) පුරස්ථ ග්‍රන්ථිය - ශුක්‍ර තරලයෙන් 30% ක් සෑදීමට දායක වේ.
   (C) පුරස්ථ ග්‍රන්ථියෙන් ස්‍රාවය කරන ප්‍රතිකැටිකාරක එන්සයිම විසර්ජනයෙන් පසු ශුක්‍රාණු කැටිගැසීමට උපකාරී වේ.
   (D) ශුක්‍ර ආශයික ග්‍රන්ථි තරලයේ ශ්ලේෂ්මල, ෆ්‍රක්ටෝස්, ඇස්කොබික් අම්ලය හා ස්ථානීය යාමක අඩංගු වේ.
   (E) පුරස්ථ ග්‍රන්ථිය හා කූපර් ග්‍රන්ථිය යන දෙකෙන්ම, ශ්ලේෂ්මල හා කැටිකාරක එන්සයිම ස්‍රාවය කරනු ලබයි.

45. මානව කශේරුවේ පිහිටන වක්‍ර පිළිබඳ පහත කිනම් ප්‍රකාශය / ප්‍රකාශ වැරදි ද?
   (A) භ්‍රෑණ අවධියේදී පූර්ව ව අවතල තනි ප්‍රාථමික වක්‍රයක් කශේරුවට ඇත.
   (B) ද්විතියික වක්‍ර හටගැනීමෙන් පසු කශේරුවේ උරස් හා ත්‍රිකාස්ථික ප්‍රදේශවල පමණක් ප්‍රාථමික වක්‍ර ඉතිරිව පවතී.
   (C) ඉපදීමෙන් මාස 7 කට පමණ පසුව ග්‍රෛවී වක්‍රය හට ගන්නා අතර එය ළදරුවාට හිස ඍජුව තබා ගැනීමට උපකාරී වේ.
   (D) දෙවන ද්විතියික වක්‍රය වන කටි වක්‍රය ඉපදී මාස 8 -10 පමණ වන විට ඇතිවන අතර, එය ළදරුවාට සිට ගැනීමට උපකාරී වේ.
   (E) කශේරුක වක්‍රවල ප්‍රධානම කෘත්‍යය ඍජු ඉරියව්ව පවත්වා ගැනීමයි.

46. මෙන්ඩල්ගේ පළමු නියමයට අනුව,
   (A) යම් ආවේණික සාධකයකට අදාල ඇලීල එකිනෙකින් වෙන් වී සෑදෙන සෑම ජන්මානුවකටම එක ඇලීලය බැගින් ලැබේ.
   (B) ප්‍රතිවිරුද්ධ ලක්ෂණ සඳහා වග කියන ඇලීල යුගල ස්වාධීනව සංරචනය වේ.
   (C) ජාන දෙකක් හෝ කිහිපයක් එකිනෙක සංයෝජනය වීම එකිනෙකින් ස්වාධීනව සිදු වේ.
   (D) ලිංග ප්‍රතිබද්ධ ප්‍රවේණිය පිළිබඳව ය.
   (E) ඇලීල නම් වූ ආවේණික සාධක දෙකක් මගින් සෑම ආවේණික ලක්ෂණයක්ම නිර්ණය කෙරේ.

47. විෂමගුණකතාව නිසා ඇතිවන ප්‍රවේණික ආබාධ පිළිබඳ පහත කිනම් ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි ද?
   (A) ඩවුන්ස් සහලක්ෂණය සහිත සියලු පුරුෂයන් ලිංගිකව නොමේරූ සහ නිසරු පුද්ගලයන් ය.
   (B) අලිංග වර්ණදේහවල ත්‍රිදේහතාව නිසා ක්ලයින්ෆෙල්ටර් සහ ලක්ෂණය හටගනී.
   (C) X වර්ණදේහයේ ඒකනදේහතාව නිසා ඇති වන ටර්නර් සහලක්ෂණය සහිත බහුතරයක් සාමාන්‍ය බුද්ධියකින් යුක්තය.
   (D) ඩවුන්ස් සහලක්ෂණය සහිත පුද්ගලයන්ට ලියුකේමියා සහ ඇල්ෂයිමර් රෝගය සෑදීමේ ඉහළ අවධානමක් ඇත.
   (E) XYY ප්‍රවේණි දර්ශය සහිත ත්‍රිදේහ පුද්ගලයන් මඳක් උසින් වැඩි නිසරු පුරුෂයන් ය.

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers • Model Answers • Study Resources
iexamhub

48. අම්ල වැසි පිළිබඳ පහත කිනම් ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි ද?

(A) අම්ල වැසි ඇති වීමට ප්‍රධාන හේතුව වන්නේ පොසිල ඉන්ධන දහනයෙන් පිටවන SO_2 හා නයිට්‍රජන්වල ඔක්සයිඩය වේ.

(B) pH අගය 5.6 ට වඩා අඩු වර්ෂාපතනයක් අම්ල වැසි ලෙස සලකයි.

(C) අම්ල වැසි මගින් දේශගුණ රටා වෙනස් කරයි.

(D) ලෙඩ්, මර්කරි වැනි බැර ලෝහ පස තුළ ක්ෂිරණයට අම්ල වැසි හේතු වේ.

(E) අම්ල වැසි මගින් වනාන්තරවලට එතරම් හානියක් නැතත් කුඩා පැළෑටිවලට සෘජුවම බලපායි.

49. පානීය ජලය පිරියම් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ පහත ප්‍රකාශන අතරින් සත්‍ය ප්‍රකාශය / ප්‍රකාශ තෝරන්න.

(A) විෂ රසායනික ඉවත් කිරීමට සක්‍රීය කල කාබන් භාවිතා කරයි.

(B) මෙහි පෙරීමේ පියවරේදී ක්ෂුද්‍ර ජීවීන් හා ප්‍රෝටොසෝවා කෝෂ්ඨ ඉවත් වේ.

(C) බොර ජලයට ඇලම් එකතු කිරීමෙන් ක්ෂුද්‍ර ජීවීන් ඉවත් වීමක් සිදු නොවේ.

(D) බහුලව භාවිතා කරන විෂබීජ නාශක ක්‍රමය ක්ලෝරිනීකෘත කිරීමය.

(E) ඕසෝන මගින් විෂබීජ නාශනයේදී ජලයට සුළු ලෙස රසක් හා ගන්ධයක් ඇති වේ.

50. ඩෙංගු රෝගය සම්බන්ධව නිවැරදි ප්‍රකාශය / ප්‍රකාශ තෝරන්න.

(A) RNA අඩංගු වෛරසයක් මගින් සෑදන වාහකයකු මගින් පැතිරෙන රෝගයකි.

(B) ඩෙංගු වෛරසයේ පැතිරීමට අජෛව සහ ජෛව සාධක බලපායි.

(C) ඩෙංගු වෛරසය සම්ප්‍රේෂණය වන්නේ ආසාදිත පිරිමි මදුරුවෙකු මාර්ගයෙනි.

(D) ආසාදිත පුද්ගලයෙකු අනිවාර්යෙන්ම රෝග ලක්ෂණ පෙන්නුම් කිරීමට හැකිය.

(E) ආසාදිත පුද්ගලයින් වෛරසය ගුණනය කරන්නන් පමණක් වේ.

***

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers • Model Answers • Study Resources
iexamhub

අවසාන වාර අනාවරණ පරීක්ෂණය-නොවැම්බර් 2021
Final Term Diagnostic Test - November 2021

ජීව විද්‍යාව II
Biology -II

13 ශ්‍රේණිය A/L 2021
Grade 13 A/L 2021

09 | S | II

B කොටස - රචනා

- **ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**
  අවශ්‍ය තැන්හිදී නම් කරන ලද පැහැදිලි රූපසටහන් දෙන්න.
  (එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 150 කි)

(05) (a) ප්‍රභාසංශ්ලේෂණය යනු කුමක්ද?

(b) C_3 ශාක ප්‍රභාසංශ්ලේෂණයේදී හරිතලවයේ කාර්යයභාරය විස්තර කරන්න.

(06) (a) ශාක ආතති යනු කුමක්ද? කෙටියෙන් හඳුන්වන්න.

(b) පාරිසරික ආතති වලට ශාක දක්වන විවිධ ප්‍රතිචාර කෙටියෙන් විස්තර කරන්න.

(07) (a) සහජ ප්‍රතිශක්තිය යනු කුමක්ද?

(b) සහජ ප්‍රතිශක්තියේ අභ්‍යන්තර ආරක්ෂණ ආකාර කෙටියෙන් විස්තර කරන්න.

(08) (a) DNA අණුවක ව්‍යුහය විස්තර කරන්න.

(b) ජාන විකෘති වර්ග උදාහරණ සහිතව කෙටියෙන් විස්තර කරන්න.

(09) (a) ක්ෂුද්‍ර ජීවී රෝග සම්බන්ධ පහත සඳහන් පද අර්ථ දක්වන්න.

- ව්‍යාධිජනකයා
- ධාරකයා

(b) ව්‍යාධිජනකතාව කෙරෙහි ව්‍යාධිජනකයන්ගේ ප්‍රචණ්ඩතා සාධක වල වැදගත්කම කෙටියෙන් විස්තර කරන්න.

(10) කෙටි සටහන් ලියන්න.

(a) බහු ඇලීලතාව

(b) ගෝලීය උණුසුම සහ දේශගුණික විපර්යාසයේ බලපෑම්

(c) පටක රෝපනය

- ❀❀❀ -

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers • Model Answers • Study Resources